No One Cleans Like..
SuperVac
3 ROOMS FROM $55
Super Vac Cleaning offer no obligation free quotes at your home or workplace, to give you an exact price. Our professional services include:
• Water Damage Restoration
• Water Damage Drying
• Curtain And Blind Cleaning
• Tile & Grout Cleaning
• Leather
• Carpet Dry Cleaning
• Carpet Steam Cleaning
• Upholstery Cleaning
• Car Interior Cleaning
• All General Cleaning & Etc.
We are domestic cleaning experts.
We have professional and friendly staff &
State-of-the-Art Truck Mounted Equipment
Same day service & Certified Technicians
SuperVac
Carpet & Upholstery Steam Cleaning
Water Damaged Restoration
Call now for a FREE QUOTE
Tel : 03 9791 2380
Fax : 03 9791 2380
Mob: 0433 775 980
Email: super.vac@hotmail.com
www.supervac.com.au

*7 වන පිටුවෙන් (පන්හිදයි පින්සලයි)*

නව නිර්මාණ අතරින් වඩාත්ම සිත්ගත්තේ රූකඩ නර්තන අංගයන් නීල නිම්නයේ අංගයත්ය. නූල්වල චලනය අනුව නැටවෙන රූකඩවල චලනය නර්තනයක් මතු නොව රංගනයක්ද වශයෙන් එකට මුහු කරගත් අන්දම විශිෂ්ටයි. දක්ෂ නර්තනාචාර්යවරයෙකු වූ ආරිය රත්න කළුආරච්චි මහත්මාගේ අර්ථවත් ගීතය පමණක් උකහාගෙන එම අර්ථය උද්දීපනය වනසේ රූකඩ නර්තනයක් මගින් රූකඩ නොවූ දරුවන් හරහා රසිකයිනට පිළිගැන්වූ අන්දම අපූර්වත්වයක් නොවේද? ලයනල් රන්වලයන් ගැයූ "හායි බායිලා" ගීයට ප්‍රසාංගිකව සුළු වශයෙන් එක් කළ රූකඩ රංගන වින්‍යාසය වඩාත් වර්ධනය කරමින් පූර්ණ නර්තනයක් දක්වා ගෙන ගිය අවස්ථාවකි මේ . කුඩා දරුවන්ගේ හික්මීම, මුහුණුවලින් පවා කළ අගිනය නිසාවෙන් මෙය වඩාත් අපගේ සිත් ගත්තේය.

චිත්‍ර ශිල්පියෙකු, වයලීන වාදනය කරන නිරූපිකාවක හා සහාය වාද්‍ය නිරූපිකාවන් පිරිසක් මෙවලම් කොටගත්, නීල නිම්නයේ අංගය කලාවේ මූලිකාංග තුන වන චිත්‍ර, නැටුම්, සංගීතය මතු නොව අභිනය, රංගනය සහ ප්‍රසාංගිකත්වය එකට කැටි කළ නිර්මානයක් විය. මයුරා වන්නමට අනුව කළ මයුරාභිමානී නර්තනය මුලදී ගායනයෙන් මෙන්ම නර්තනයෙන්ද වන්නම් ස්වරූපයට වඩා වෙනස් මඟක් ගත්තේ අවසනදී ක්‍රමයෙන් සම්ප්‍රදායික නාදරටා හා නර්තන රටාවන්ට පිවිසියේය. වැදි නැටුම වෙනත් ගෝත්‍රික නැටුමකට හුරුවූයේ ඊට යා වූ බඹර කැපිල්ලට අනුගතව ලියැවී ගැයුණ ගී රිද්මයටයි. එසේ වුවද ඒවා සම්ප්‍රදායේ සීමා දැන හැඳින කළ නිර්මාන වීය. ආචාර්යවරියගේ මුහුකුරා ගිය බව ඉන් දෘෂ්‍යමාන විය.

ප්‍රසාංගවාසාන ස්තුති කථාව ඉතාම කෙටි ආදර්ශමත් කතාවක් වූ අතර ආචාර්යවරියගේ ශිල්පීය මෙන්ම කළමණාකරණයේ පෞර්ෂ්‍යය ඉන් මොනවට දිස්වීය.

කිසිඳු බැඳීමකින් තොරව හුදෙක් ප්‍රේක්ෂකයෙකු ලෙසින් පමණක් විඳ සටහන් තැබීමට මෙවර වාසනාවන්ත වූයෙමු. අපි යමෙකුගේ උත්සාහය අපට දැනෙනා අයුරින් කළ සටහනකි මේ.

වර්ෂ 2011 මාර්තු 13 ද එම ශාලාවේදීම ප්‍රසංගය තුලින් හමුවීමට නර්තනාචාර්යවරිය ශපත වූයේ ඉලක්කයන් හඹා යාමේ අධිෂ්ඨාන ශක්තියද පාමිනි. පෙර ශිල්ප දැක්මට වඩා බොහෝ ඉදිරියට පැමිණ ඇති ඇයට මීටත් වඩා සාර්ථක ශිල්ප දැක්මකට ධෛර්යය ලැබේවා යි ආශිර්වාද කරන්නෙමු අපි.

Delicious Cakes
Wedding Cakes
Birthday Cakes
Engagement Cakes
Anniversary Cakes
Christmas Cakes
Easter Cakes
Cakes for all occasions
Sanjeewanie
Craigieburn
Phone 9303 8321
Mobile 0402 637 958
email sanjeewanie@y7mail.com

## බ්ලොග් කතන්දර

### අක්කිගෙ නුවණ - සුනේත්‍රා හෙවත් අවිචාර සමය

උසස් පෙල විභාගෙ කළා ට පස්සෙ මට කාලයක් ඉබාගාතෙ හැසිරෙමින් ඔහේ වාත වෙවී ඉන්න වුනු කාලයක් ආව. මේ දවස් වල දි මගේ පිහිට ට ආවේ ගම්සභා පුස්තකාලය යි.

පරණ පුරුද්දට ගම් සභාව කියල කිව්වට මේක ප්‍රාදේශීය සභාව. ඉතිං, පුස්තකාලෙ තියෙන්නෙත් අපේ ගමේ නෙමේ. හැතැප්ම දෙක හමාරක් විතර දුරින් තියෙන පුංචි ටවුමේ.

මාසයක් දෙකක් විතර කාලයක් මං ඒ පුංචි පුස්තකාලෙ පදිංචි වෙලා වගෙයි හිටියෙ. උදේ අට වෙන කොට එක්කො බස් එකේ නැත්තං සයිකලේ නැගිල යනව. දවල්ට කන්න ගෙදර එනව. කාපු ගමං ආයෙ ගිහින් හවස හයට විතර තමයි ඊළඟට ගෙදර එන්නෙ. ඔය අතරතුර කළේ උදේම දවසෙ පත්තර ටික බලනවා. ඊට පස්සෙ පොත් එකක් පස්සෙ එකක් බලනවා.

කාලෙන් කාලෙට එක එක අය පුස්තකාලය බාරව සේවය කරමින් හිටිය මට මතකයි. මේ කියන කාලෙ හිටියෙ මට වැඩිය ඔන්නම් අවුරුදු දෙක තුනක් විතර වයස කෙල්ලෙක්. පුස්තකාල සේවය ගැන ඉගෙන ගත්තු කෙනෙක් වගේ කියල නම් පෙනුනෙ නෑ. කවුරු හරි ගම්සභාවෙ ජොබ් එකට දාපු කෙනෙක් කියලයි මං හිතන්නෙ.

ඔන්න එක දවසක් මට පුස්තකාලෙ යන්න බැරි උනා එදා ආපහු ඉස්කෝලෙට ද කොහෙද ගිය හින්ද. පහුවදා උදේම ආපහු පුස්තකාලෙට ගිය ගමං මං බලන්න හැදුවේ ඊට කලින් දා පත්තර ටික. කවදාකවත් නැති විදියට වෙනද පරණ පත්තර තියෙන තැන හිස්ම හිස්.

ඊයෙ පත්තර ආවෙ නැද්ද? මං පුස්තකාලාධිපති නෝන ගෙන් ඇහැව්ව. මට ඕනෑ ඊයෙ පත්තර ටික බලන්න.

අපි අලුතින් තීරණය කළා මාසයක් පරණ පත්තර අයින් කරන්න. මං පරණ පත්තර සේරම අරං ඉස්ටෝරුවට දාලයි තියෙන්නෙ එයා කිව්ව.

පරණ පත්තර නෙමේ මං හොයන්නෙ ඊයෙ එක.

ඉතිං අද ජූනි පලවෙනිද නෙ. මං ගිය මාසෙ පත්තර සේරම අයිං කළා...

කොහොමද අපේ පුස්තකාලාධිපතිතුමිය ගෙ නුවණ?

වදෙන් පොරෙන් කැමති කරවගෙන ඉස්ටෝරු කාමරේ ඇරල බැලින්නම් ඊයෙ පත්තරයි, අනිත් පත්තරයි කියල වෙනසක් නෑ සේරම එක ගොඩේ. පැය කාලක් විතර ගියා පත්තර ටික හොයා ගන්න.

මේ, ඒ නෝන ගැන ම තවත් හොඳ කතාවක්.

ඔන්න දවසක් මං උදෙන්ම පුස්තකාලෙට යන කොට එතන මහ ජරමරයක්. කබඩ් දෙක තුනේ තිබුණු පොත් සේරම මේස උඩ ගොඩ ගහලා. එදා ස්ටොක් ටේකිං. ඒ කියන්නෙ වාර්ෂික තොග ගණං බැලීමේ දිනය.

අද අපි ස්ටොක් ගන්නවා. පොත් බලන්නවත්, ගෙනියන්නවත් බැහැ පුස්තකාලාධිපතිතුමිය මට කිව්වා. අඩු වශයෙන් පත්තර ටිකවත් බලන්න පුළුවනි නෙ කියල මං එතන රැඳුණා.

එදා පුස්තකාලාධිපතිතුමිය ගෙ සහයට නංගි කෙනෙකුත් ඇවිත්.

අපි මේ පොත් සේරම එක එක විෂයයන් වලට වෙන් කරන්න ඕනෑ නංගී. ඊට පස්සෙයි ගණං කරන්නෙ.

ඒ කියන්නෙ අක්කේ?

ඒ කියන්නෙ, නවකතා, කෙටිකතා, කවි, පරිවර්තන, ඉතිහාසය, විද්‍යාව අන්න ඒ වගේ.

ඔන්න දෙන්න එකතුවෙලා වැඩේ පටන් ගත්ත. පුස්තකාලාධිපතිතුමිය ටක් ටක් ගාල වැඩේ කරගෙන යනවා. ඒත් සහයට ඉන්න පොඩි නංගිට පොඩි පොඩි ප්‍රශ්ණ.

අක්කෙ මේ පොත කොයි ගොඩට ද දාන්නෙ.

කෝ බලන්න පොතේ නම. ආ සුනේත්‍රා නේද? දාන්න ඕක ඉතිහාසය ගොඩට.

නංගි ට හරිම පුදුමයි.

අනේ අක්ක හින්ද හොඳයි. මේ සේරම පොත් ගැන දන්නවා. මට නම් හිතාගන්නවත් බැහැ.

මං මෙතන ඉන්න ගමං හුඟක් පොත් කියවනවනෙ, නංගී... එතුමිය කිව්වෙ පුංචි ආඩම්බර හිනාවකුත් එක්කයි.

ඉතිං එදායින් පස්සෙ ඩබ්ලිව්.ඒ. ද සිල්වා ලියපු සුනේත්‍රා හෙවත් අවිචාර සමය නවකතාව හමු වුනේ ඉතිහාස පොත් තියෙන තට්ටුව බලපු අයට විතරයි.

පත්තර ටික බලල මං පැය භාගයකින් විතර ගෙදර ගියා. ඒක හින්ද අනිත් පොත් තෝරපු හැටි ගැන හරියටම දන්නෙ නෑ. ඒත් සුනේත්‍රා නවකතාව වර්ගීකරණය කළ විදියට ම ගියා නම්■

ඩබ්ලිව්.ඒ. ද සිල්ව ම ලියපු හිඟන කොල්ලා, රදළ පිළිරුව නවකතා තියන්න ඇත්තෙ සමාජ විද්‍යා පොත් එක්ක, ලක්ෂ්මී හෙවත් නොනැසෙන රැජින පරිවර්තන ගොඩේ, පියදාස සිරිසේන ගෙ විමලතිස්ස හාමුදුරුවන් ගේ මුදල් පෙට්ටිය බුද්ධාගම පොත් එක්ක.

මාර්ටින් වික්‍රමසිංහ ගෙ ගම් පෙරලිය දාන්න ඇත්තෙ දේශපාලන විද්‍යාව ගොඩේ වෙන්න ඕනෑ.

පොලිසියෙ කෂ්ටියත් කලා ය කියන්නෙ එහෙමනෙ ජේ.වී.පී කචල් කාලේ

**කතන්දරකාරයා**
http://kathandara.blogspot.com/